# තනතුරු ඇබෑර්තු

## තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාව

## (2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ ව්‍යවස්ථාපිත)

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ තොරතුරු තාක්ෂණ සහකාර තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම තනතුරට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක 01/2025 අනුව වැටුප් ගෙවනු ලැබේ.

තොරතුරු තාක්ෂණ සහකාර (තනතුර 01)

සුදුසුකම් :

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) මට්ටමට නොඅඩු මට්ටමක තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

වයස : අවුරුදු 22 නොඅඩු හා 45ට නොවැඩි විය යුතු ය.

වැටුප් ක්‍රමය : MA 2-1 -2025 - රු. (50,540-10x540-7x630-4x890-20x1,190-රු. 87,710)

බඳවා ගැනීමේ ක්‍රමවේදය :

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| | | |
|---|---|---|
| 01. | අදාළ පළපුරුද්ද | ලකුණු 30 |
| 02. | අදාළ අතිරේක සුදුසුකම් | ලකුණු 30 |
| 03. | වෙනත් කාර්යය සාධනයන් හා කුසලතා | ලකුණු 15 |
| 04. | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කාර්ය සාධනය මුළු ලකුණු | ලකුණු 25 |
| | **මුළු ලකුණු** | **100** |

පොදු කොන්දේසි

1. රාජ්‍ය හෝ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල/ කොමිෂන් සභාවල සේවය කරන අය තම අයදුම්පත ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු ය.
2. තෝරාගනු ලබන අය 1956 අංක 22 දරන රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති යටතේ පනවා ඇති නීතිරීතිවලට යටත් වේ.
3. පත් කරනු ලබන දින සිට සේවක අර්ථ සාධන අරමුදලට කොමිෂන් සභාව මගින් 12% ක් හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල සඳහා 3% දායක මුදලක් ගෙවනු ලැබේ.
4. පත්වීම්ලාභීන් සඳහා අග්‍රහාර රක්ෂණ ක්‍රමය යටතේ වෛද්‍ය රක්ෂණ ආවරණය ලැබේ.
5. සියලු තනතුරු සඳහා රජය අනුමත දීමනා හිමි වේ.

අයදුම්කරුවන් තම සහතිකවල ඡායා පිටපත් සමඟ තමන් විසින් පිළියෙල කර ගන්නා ලද ජීව දත්ත අඩංගු අයදුම්පත් **2026.02.27 දින පෙ. ව. 4.00**ට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට එවිය යුතු යි. කවරයේ වම් කෙළවරෙහි "තොරතුරු තාක්‍ෂණ සහකාර තනතුර" ලෙස සඳහන් කළ යුතු ය.

අධ්‍යක්ෂ ජනරාල්,
තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම
පිළිබඳ කොමිෂන් සභාව.

කාමර අංක 203,
ගොඩනැගිලි අංක 02,
බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව,
කොළඹ 07.

02 - 78/1